*සැ. යු.* - 2023.06.02 දින පළ කරන ලද අංක 2,335 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,336 - 2023 ජුනි මස 09 වැනි සිකුරාදා - 2023.06.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | 696 |
| පළාත් පාලන නිවේදන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 700 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ජුනි මස 30 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජුනි මස 16 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

695- B 824562— 5,403 (2023/06)

# බඩුබාහිරාදිය විකිණීම්

## ගලිගමුව ප්‍රාදේශීය සභාව - පිටගල්දෙනිය

ගලිගමුව ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් වාහන/යන්ත්‍ර 2023.06.30 වැනි දින පෙ.ව. 10.30ට ගලිගමුව ප්‍රාදේශීය සභාවට අයත් තොරණගහපිටිය පැරණි ගම් සභා භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත ය.

මෙම වාහන/යන්ත්‍ර වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම ප්‍රාදේශීය සභාවට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව වාහන/යන්ත්‍ර එදින ම සභා පරිශ්‍රයෙන් රැගෙන යා යුතුයි.

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත වාහන/යන්ත්‍ර විස්තරය

| *අනු. අංකය* | *ලියාපදිංචි අංකය* | *යන්ත්‍රය/වාහනය* | *අයිතම* |
|---|---|---|---|
| 01. | SGHG 4943 | අත් ට්‍රැක්ටරය | 01 |
| 02. | SGGK 4848 | යතුරුපැදිය (යකඩ බරට - මේ වන විට අංක තහඩු අවලංගු කර ඇත.) | 01 |

**2023.06.26 දින සිට 2023.06.28** දින දක්වා පෙ. ව. **9.30 සිට** ප.ව. **3.00** දක්වා ඉහත භූමියේ තබා ඇති වාහන පරීක්ෂාකර බැලිය හැක.

එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2023 මැයි මස 29 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

06-161

---

# පළාත් පාලන නිවේදන

## කුලියාපිටිය නගර සභාව

විනෝද බදු පැනවීම

**1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, කුලියාපිටිය නගර සභාව විසින් 2022.12.13 දින මහ සභා තීරණ අංක 06.7 යටතේ සම්මතකර ඇති යෝජනාව වයඹ පළාත් ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ,
ආණ්ඩුකාරවර,
වයඹ පළාත.

2023 මැයි මස 11 වැනි දින,
කුරුණෑගල ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ව කුලියාපිටිය නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙ හි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුලුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් සියයට දහය (10%) ට සමාන බද්දක් පනවා අය කළ යුතු යැයි ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තියේ විධිවිධාන අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ *ගැසට් පත්‍රයේ* පළකිරීමටත්, පෙර කී *ගැසට් පත්‍රය* පළ කරන මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද මහ සභාව යෝජනා කරන්නී ය.

06-163

---

## කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාව

### කෝරලයිපත්තු ප්‍රාදේශීය සභා වසමේ පිහිටුවා ඇති වීදි හා කානු සම්බන්ධව ජනතාව දැනුවත් කිරීමයි

1987.05.12 වන දින අංක 453/18 දරන *අතිවිශෙෂ ගැසට්* නිවේදනයේ සඳහන් කර ඇති කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාවට අයත් මායිම් බව සඳහන් කර ඇති නිවේදනය හා 2015.08.21 වැනි දින පළ කර ඇති 1928/26 දරන *අතිවිශෙෂ ගැසට්* නිවේදනයේ සඳහන් කර ඇති කොට්ඨාස 14 තුළ ආවරණය වන පහත සඳහන් ග්‍රාම නිලධාරී වසම්වල ඇතුළත් වන මායිම තුළ දක්නට ලැබෙන කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරන පුද්ගලික අයට අයත් මාර්ග හැර අනෙක් සියලුම ප්‍රධාන මාර්ගයන්, අතුරු මාර්ගයන් හා හරස් මාර්ගයක් හා අතුරු පටුමග සියල්ලම කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාවට අයත් වේ. මෙයට සම්පූර්ණ අයිතිය කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාවට වේ.

තව ද, එම මායිම තුල දක්නට ලැබෙන ස්වභාවික ජල මාර්ගයන්, ප්‍රධාන ජල මාර්ගයන් (ආරප්පර්රයි) හා කානු පිහිටුවා ඇති ප්‍රදේශයන් සියල්ලම කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාවට අයත් උරුමය බව 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥාපනත 16 වන වගන්තියට අනුව 2023.03.08 වැනි දින පැවැත්වූ මහජන නියෝජිතයන්ගේ ජනරාල් රැස්වීමේ දී තීරණ අංක KPPS/M. MEETING/60- II/MARCH/10/2023 අනුව තීරණය කර ඇති බව ජනතාවට මෙමගින් දන්වා සිටිමු.

අදාළ දැන්වීම සම්බන්ධව තනි අයෙකුට/කණ්ඩායමකට/හෝ සමාජ සංවිධානවලට විරුද්ධතාවක් ඇත්නම් සුදුසු ලියකියවිලි හරහා මෙම දැන්වීම *ගැසට්* නිවේදනයේ නිකුත් කළ දිනයේ සිට දින 30ක් ඇතුළත සෘජුවව හෝ තැපැල් මගින් කාර්යාලයේ ඉදිරිපත් කළ හැකි ය.

209 - පේරිල්ලාවෙලි, 209 A - මුරුත්තා නෙයි, 209D - කුඩුම්බිමෙල්, 200A - තිහිලිවෙට්ටෙයි, 209 B - කෝරාවෙලි, 209C - පූලාකාඩු, 206 - වාලච්චෙනෙයි, 04 මුස්ලිම්, 206 D - වාලච්චේනෙයි මුස්ලිම් දකුණ, 206A - බයන්දූරච්චේනෙයි උතුර, 206 B - වාලච්චේනෙයි 5 මුස්ලිම්, 205 - වාලච්චේනෙයි දෙමළ, 205A- පුදුකුඩිඉරිප්පු, 205C - නාසිවන්තීව්, 204 - කල්කුඩා, 205 B - පේතාලෙයි, 204A- කල්මඩු, 205D - කන්නහිපුරම්, 206 C - බයන්දූරච්චේනෙයි, 208A- මාවඩිච්චේනෙයි, 208 D - සෙම්මන්ඕඩෙයි, 202 - මීරාඕඩෙයි දෙමළ, 202A - කරුවාකර්ණි, 202 B - කින්නෙයිඅඩි, 202 C - සුංගාන්කර්ණි, 203 B - කුඹුරුමූලෙයි, 203 - කිරාන් නැගෙනහිර, 203A - කිරාන් බටහිර, 200 - සන්දිවෙලි, 203 C- කෝරකල්ලිමඩු, 199 - මොරොකොට්ටාන්චේනෙයි, 199A- දේවපුරම්, 200 B - පාලෙයිඅඩිතොන,

කනගරෙට්නම් කමලනේසන්,
සභාපති,
කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාව,
වාලච්චේනයි.

කෝරලයිපත්තු ප්‍රාදේශීය සභාව,
වාලච්චේනයි,
දු. ක. අංකය : 065 - 2257275

06-139

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

ගෝසාතක ආඥාපනත (271 වන අධිකාරය)

මෙහි පහත දක්වෙන විස්තර සඳහන් ස්ථානයන් හි ගවමස් වෙළඳාම් කිරීම සඳහා 2023 වර්ෂයට බලපත්‍ර ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති බවට ගෝසාතක ආඥාපනත 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍ර ලබාදීමට විරෝධතාවයන් පවතී නම් උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි ඕනෑම අයෙකුට විරෝධතා ඉදිරිපත් කළ හැකිය. එම විරෝධතාවලට හේතු සහිතව පිටපත් 02 කින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් (දින දාහතරක්) ඇතුලත මා වෙත ඉදිරිපත් කරන ලෙසට මෙයින් කාරුණිකව දන්වමි.

| *නම හා ලිපිනය* | *වෙළඳ ස්ථානයේ ලිපිනය* | *වෙළඳාම් කරන මස් වර්ගය* |
|---|---|---|
| එම්. එස්. එම්. ලරීප් | අංක 4/ඉ, කලුගමුව පාර, ගෙලිඔය | ගවමස් |

එස්. කේ. ගුණසේකර,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

2023 මැයි මස 29 වැනි දින,
ගෙලිඔය උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

06-200

---

## හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව විසින් 2023 පෙබරවාරි 17 දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01 යටතේ සභාව සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරන එල්. එච්. වී. ඉරෝෂණී වන මා විසින් අනුමැතිය දෙනු ලැබූ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. වී. ඉරෝෂණී,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
අනුරාධපුර.

2023 මැයි මස 15 වැනි දින,
අනුරාධපුර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ දී ය.

***යෝජනා අංක 01***

***යෝජනාව ඉදිරිපත් කිරීම ගරු සභාපතිතුමා***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, හොරොව්පොතාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සිතියමෙන් විස්තර කරන ප්‍රදේශය සඳහා උපරිම මට්ටමින් සේවාව ව්‍යාප්ත කිරීමට හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇති හෙයින් දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් පිළිගත යුතු බවත්, එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට අනුරාධපුර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාකළ යුතු බවටත් හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

# Horowpothana Rate Area

- උතුර


| ස්ථාන අංකය | අක්ෂාශ | දේශාශ | ස්ථානය |
|---|---|---|---|
| A | 8.56345 | 80.83302 | කහතහ ඉදිරිපිට අතුරු මාර්ගය |
| B | 8.56301 | 80.83394 | පිළිසරු මධ්‍යස්ථානය හංදිය |
| C | 8.56111 | 80.83421 | කමල් මහතාගේ නිවස |
| F | 8.56023 | 80.83397 | ලිලි හාල් මෝල |
| G | 8.55702 | 80.83442 | සහනාධාර මාවත පළවනි පටු මග |
| H | 8.55738 | 80.83617 | සහනාධාර මාවත දෙවනි පටු මග |

- නැගිනහිර

| ස්ථාන අංකය | අක්ෂාශ | දේශාශ | ස්ථානය |
|---|---|---|---|
| J | 8.55563 | 80.83914 | සහනාධාර මාවත කුට්ටිගල් මාර්ගය |
| K | 8.55781 | 80.84324 | බණ්ඩාර මහතාගේ නිවස |
| L | 8.5521 | 80.83651 | ගයාශ්‍රිගේ නිවස අසල |

- බස්නහිර

| ස්ථාන අංකය | අක්ෂාශ | දේශාශ | ස්ථානය |
|---|---|---|---|
| AD | 8.54688 | 80.82619 | නානායම් ඉදිරිපිට මාර්ගයේ දකුණ |
| AJ | 8.55142 | 80.82907 | ශිලරතන අනුස්මරණ ආගමික ස්ථානය |
| AK | 8.55405 | 80.82729 | යුධ හමුදා කඳවුර ඉදිරිපිට නාම පුවරුව |
| AM | 8.55616 | 80.82521 | 46/2 බෝක්කුව දකුණ වව්නියා ප්‍රධාන පාර |
| AO | 8.55937 | 80.82819 | සමගිගම ප්‍රජාශාලාව අසල |





AB - 8.53840, 80.81974
AC - 8.54485, 80.82647
AD - 8.54688, 80.82619
AE - 8.54740, 80.82893
AF - 8.54839. 80.82999
AG - 8.54984, 80.82946
AH - 8.55016, 80.82789
AI - 8.55124, 80.82838
AJ - 8.55142, 80.82907
AK - 8.55405, 80.82729
AL - 8.55513, 80.82548
AM - 8.55616, 80.82521
AN - 8.55611. 80.82679
AO - 8.55937, 80.82819
AP - 8.55876, 80.83061

A - 8.56345, 80.83302
B - 8.56301, 80.83394
C - 8.56111, 80.83421
D - 8.56138, 80.83357
E - 8.56030. 80.83296
F - 8.56023, 80.83397
G- 8.55702, 80.83442
H - 8.55738, 80.83617
I - 8.55673, 80.83664
J - 8.55563, 80.83914
K- 8.55781, 80.84324
L - 8.5521, 80.83651
M -8.55380, 80.83613
N - 8.55421, 80.83395
O - 8.55394, 80.83223
P - 8.55267, 80.83168
Q - 8.55205, 80.83183
R- 8.55106, 80.83330
S - 8.55028, 80.83389
T - 8.54922, 80.83260
U - 8.54801, 80.83321
V - 8.54794, 80.83098
W - 8.54635, 80.82922
X - 8.53728, 80.82007
Y - 8.53749, 80.81932
Z - 8.53820, 80.81945

- දකුණ

| ස්ථාන අංකය | අක්ෂාශ | දේශාශ | ස්ථානය |
|---|---|---|---|
| S | 8.55028 | 80.83389 | ත්‍රිකුණාමල පාර වයර් කඩය අසල |
| U | 8.54801 | 80.83321 | අලුත්ඔය පාර පළමු පාලම |
| W | 8.54635 | 80.82922 | ගල්කන්ද ප්‍රජා ශාලාව අසල |
| X | 8.53728 | 80.82007 | අනුරගේ නිවස ඉදිරිපිට |
| Y | 8.53749 | 80.81932 | පශුවෛද්‍ය මධ්‍යස්ථානය අසල මාර්ගය ආරම්භක ස්ථානය |



# විවිධ දැන්වීම්

සංශෝධනයයි

**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව**

2022 නොවැම්බර් මස 25 වැනි දින පළ කරන ලද අංක 2308 *ගැසට් පත්‍රයේ* පළකරන ලද රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව - 2023 වර්ෂය සඳහා වූ ජල ගාස්තු පැනවීම සංශෝධනය කිරීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108 වගන්තිය යටතේ පොදු උපයෝගී සේවා (ආ) ජල සම්පාදනය සම්බන්ධව සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, අනුමත කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ජල සම්පාදන ව්‍යවස්ථාවේ 10 වන උපඡේදය යටතේ 2023.02.16 දින පැවති මහ සභා රැස්වීමේ ඒකමතික තීරණය අනුව යෝජනා අංක (05.06) යටතේ පහත දක්වෙන ජල ගාස්තු සංශෝධනය කිරීම සහා සම්මත කරන ලද බව මෙයින් මහජනයා වෙත නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. නදීකා එන් අබේකෝන්,
සභා ලේකම්,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2023 අප්‍රේල් මස 24 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව,
ආඳාඋල්පත, ඌරණිය.

යෝජනාව

උපලේඛනය I

*ගාස්තු අය කිරීම - ගෘහස්ථ*

**පරිහරණ ගාස්තුව**

| *ඒකක ගණන* | *ඒකකය රු. ශත* | *ස්ථාවර ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 1 - 5 | 18.00 | 250.00 |
| 6 -10 | 23.00 | 250.00 |
| 11 - 15 | 33.00 | 250.00 |
| 16 - 20 | 68.00 | 250.00 |
| 21 - 25 | 100.00 | 250.00 |
| 26 - 30 | 145.00 | 250.00 |
| 31 - 40 | 160.00 | 250.00 |
| 41 - 50 | 165.00 | 250.00 |
| 51 ට වැඩි | 200.00 | 250.00 |

*ගාස්තු අය කිරීම - වාණිජ*

**පරිහරණ ගාස්තුව**

| *ඒකක ගණන* | *ඒකකය රු. ශත* | *ස්ථාවර ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 1 - 5 | 120.00 | 320.00 |
| 6 -10 | 120.00 | 320.00 |
| 11 - 15 | 120.00 | 320.00 |
| 16 - 20 | 120.00 | 320.00 |
| 21 - 25 | 120.00 | 320.00 |

| *ඒකක ගණන* | *ඒකකය රු. ශත* | *ස්ථාවර ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 26 - 30 | 120.00 | 320.00 |
| 31 - 40 | 120.00 | 320.00 |
| 41 - 50 | 120.00 | 320.00 |
| 51 ට වැඩි | 200.00 | 320.00 |

*ගාස්තු අය කිරීම - රජයේ කාර්යාල*

**පරිහරණ ගාස්තුව**

| *ඒකක ගණන* | *ඒකකය රු. ශත* | *ස්ථාවර ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 1 - 5 | 50.00 | 300.00 |
| 6 -10 | 50.00 | 300.00 |
| 11 - 15 | 50.00 | 300.00 |
| 16 - 20 | 50.00 | 300.00 |
| 21 - 25 | 55.00 | 300.00 |
| 26 - 30 | 55.00 | 300.00 |
| 31 - 40 | 60.00 | 300.00 |
| 41 - 50 | 75.00 | 300.00 |
| 51 ට වැඩි | 155.00 | 300.00 |

06-152

---

## සංශෝධනයයි

**නුවරඑළිය මහා නගර සභාව**

2022.12.30 දින පළකරන ලද අංක 2313 *ගැසට් පත්‍රයේ* පළ වූ 12-693/4 නිවේදනය පහත සඳහන් පරිදි එනම් සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ පිළිගනු ලැබ ඇති හෝටල් හෝ ආපන ශාලා හෝ නවාතැන්වලින් එම ව්‍යාපාරයෙන් පසුගිය වර්ෂයේ ලැබීම් මත සියයට දශම පහයි පහක (0.55%) බද්දක් ගෙවිය යුතු ය.

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ අනුමත කර ඇත්තා වූ හෝ අනුමත කර ඇති හෝටල්වලින් බදු අයකර ගැනීම 2023 වර්ෂය**

නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශය තුළ යම් සංචාරක හෝටලයක්, ආපන ශාලවක් හෝ ලැගුම්හලක් වශයෙන් පාවිච්චි කරන ලබන්නා වූ ද, ඒ හෝටලය, ආපන ශාලාව, ලැගුම්හල ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදංචි කර ඇත්තා වූ අවස්ථාවක එම හෝටලයේ ආපන ශාලාවේ හෝ ලැගුම් හලේ එම වර්ෂයට පෙරාතුව වූ වර්ෂ සඳහා වූ ලැබීම්වලට අනුකූලව එම ලැබීම්වලින් සියයට දශම පහයි පහක (0.55%) ක මුදලක් බලපත්‍ර ගාස්තුව ලෙස එම හෝටලය, ආපන ශාලාව, ලැගුම් හල පවත්වාගෙන යන අයගෙන් අය කිරීමට 2022.10.11 දි 04-iii-101 අංක දරන තීරණය මගින් තීරණය කර ඇත. එබැවින්, හෝටලයක්, ආපන ශාලාවක්, ලැගුම් හලක් පවත්වාගෙන යන අය විසින් එම මුදල ගෙවිය යුතු බව දැනුම් දෙමි.

එස්. පී. කේ. බෝධිමාන්න,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව - නුවරඑළිය.

2023 මාර්තු මස 13 වැනි දින,
නුවරඑළිය මහා නගර සභා කාර්යාලයේ දී ය.

06 - 180/1

සංශෝධනයයි

**නුවරඑළිය මහා නගර සභාව**

2022.12.30 දින පළකරන ලද අංක 2313 *ගැසට් පත්‍රයේ* පළ වූ 12-693/5 නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු ය.

2023 වර්ෂය සඳහා පහත සඳහන් ගාස්තු අය කිරීමට 2022.12.13 දින අංක 04-111-4 දරන තීරණය මගින් තීරණය කර ඇත.

ජල ගාස්තු අය කිරීම - 2023

| ආයතන | ගාස්තුව |
|---|---|
| වානිජ ආයතන/කාර්මික ආයතන හා ඉදිකිරීම්/ආයෝජන මණ්ඩල හා අනුමත කර්මාන්ත ශාලා/සංචාරක හෝටල්/පෞද්ගලික පාසල්/රජයේ ආයතන/රෝහල් | පළමු ඒකකයේ සිට එක් ඒකකයක් සඳහා රු. 52.00 + ස්ථාවර ගාස්තුව රු. 80.00 + රජයේ බදු මුදල් |
| රජයේ පාසල් (ළමුන් 100 ක් සඳහා) මසකට (ගුරු නිල නිවාස සඳහා මෙම අයකිරීම අදාළ නොවේ.) | ස්ථාවර ගාස්තු රු. 60.00 + ගෘහ A යටතේ බිල් ගතවන මුළු බිල්පතෙන් 40%ක් නිදහස් |
| ආගමික ස්ථාන | ස්ථාවර ගාස්තු රු. 60.00 + ගෘහ A යටතේ බිල් ගතවන මුළු බිල්පතෙන් 40%ක් නිදහස් |
| පොදු ජල කරාම | පළමු ඒකකයේ එක් ඒකකයක් සඳහා සිට රු. 3.00 + ස්ථාවර ගාස්තුව රු. 60.00 + රජයේ බදු මුදල් |
| විදුලි පොම්ප යොදවා ජලය ලබාදෙන ස්ථාන (හැඩන්හිල්, යුනික්වීව්, බොනවිස්ටා, කළාපුර, ගැමුණු පුර, නේස්බි, හාවාඑළිය ලෝ ඒරියා | බිලට අමතරව 20% ක් අය කෙරේ. |
| තොග සම්බන්ධතා (Bulk Connection) සඳහා | 3/4 සඳහා ස්ථාවර ගාස්තුව රු. 1,000.00 + රජයේ බදු මුදල් |
| | 1" සඳහා ස්ථාවර ගාස්තුව රු. 1,250.00 + රජයේ බදු මුදල් |
| | 2" සඳහා ස්ථාවර ගාස්තුව රු. 1,500 + රජයේ බදු මුදල් |
| | 3" සඳහා ස්ථාවර ගාස්තුව රු. 1,750.00 + රජයේ බදු මුදල් |
| | සඳහා ස්ථාවර ගාස්තුව රු. 2,000.00 + රජයේ බදු මුදල් |

එස්. පී. කේ. බෝධිමාන්න,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව - නුවරඑළිය.

2023 මාර්තු මස 13 වැනි දින,
නුවරඑළිය මහා නගර සභා කාර්යාලයේ දී ය.

06 - 180/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.